## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss – 2022)

(7 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 7 ශ්‍රේණිය- තෙවන වාරය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **7 ශ්‍රේණිය තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 1. නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිලි කරයි. | 1.7 අත්දැකීම් ඇසුරින් ආනුෂංගික කලා හඳුනා ගනියි. | ▪ ස්වභාවික පරිසරයෙන් ඇසෙන සහ දකිනවිවිධ දේ නිරීක්ෂණය කරයි.<br>▪ වේදිකා නාට්‍යයකට ශබ්ද යොදා ගැනීමේදී විවිධ උපක්‍රම භාවිත කරයි. | ▪ ස්වභාවික පරිසරයේ ඇසෙන සහ පෙනෙන දෑ අවබෝධ කර ගැනීම සහ ඒවා නාට්‍ය සඳහා යොදා ගැනීමට හැකි බව අවබෝධ කර ගැනීම. | 1.7 - පරිසරයෙන් අසන දකින දෑ වේදිකාවට | 01 |
| | | ▪ ආනුෂංගික කලා යනු මොනවාදැයි පැහැදිලි කර ගනියි.<br>▪ වේදිකා නාට්‍යයක ඇති ආනුෂංගික කලා පිළිබඳ නිරීක්ෂණය කරයි. | ▪ වේදිකා නාට්‍යයක් සඳහා භාවිතා කරන විවිධ ආනුෂංගික කලා හඳුනා ගැනීම සහ එයින් ඇති ප්‍රයෝජන අවබෝධ කර ගැනීම. | 1.7.2 - ආනුෂංගික කලා හඳුනාගැනීම. | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.6 සාමූහික ව කතාන්දර ගොතයි.<br><br>2.7 ඓතිහාසික කතා තත්කාලීන පරිසරය සමඟ ගළපයි.<br><br>2.9 වෙස් මුහුණු හා මකුට සකස් කරයි. | ▪ අවස්ථානුකූලව උචිත පරිදි කතාවක් ඉදිරිපත් කරයි.<br>▪ නිර්මාණාත්මකව කතාව ගොතයි.<br><br>▪ සාර්ථක කතන්දරයක මූලික ලක්ෂණ දක්වයි.<br>▪ ඓතිහාසික කතා වලට පදනම් වූ ජනකතා සොයයි.<br>▪ එම කතා පුවත් ආශ්‍රය කරගෙන නාටය පෙළක් රචනා කරයි.<br><br>▪ ඉවතලන දේ වලින් ප්‍රයෝජන ගැනීමට හැකියාව ලබයි.<br>▪ රංගනයේදී යොදා ගත හැකි වෙස්මුහුණක් නිර්මාණය කරයි.<br>▪ විවිධ හැඟීම් ප්‍රකාශ වන පරිදි මුහුණු නිර්මාණය කරයි. | ▪ කතන්දරයක් සිසුන් සාමූහිකව එකතු වී නිර්මාණය කර දැක්වීම සහ කතන්දරයක සාර්ථකත්වයට හේතුවන මූලික ලක්ෂණ විමසා බැලීම.<br><br>▪ ඓතිහාසික කතා පුවත් හඳුනාගැනීම සහ ඒවා ආශ්‍රයෙන් පරිකල්පනය මෙහෙයවා නාට්‍ය පිටපතක් රචනා කිරීම.<br><br>▪ ඉවතලන දේ වලින් රංගනය සඳහා වෙස් මුහුණක් නිර්මාණය කර ගැනීම සහ වෙස් මුහුණක් භාවිතයෙන් රංගනයට ලැබෙන පහසුව පිළිබඳව අවබෝධ කරගැනීම. | 2.6.1 - කතා ගෙතමු - ගොතා කියමු<br><br>2.7.1 - අපි අප ගැන සොයමු<br><br>2.9 - වෙස් මුහුණු සහ මකුට සාදා පැළඳ රඟමු අපි | 02<br><br>01<br><br>02 |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි. | 3.6 අභිරූපණයෙහි නිරත වෙයි. | ▪ විවිධ චරිත සහ ක්‍රියා අභිරූපණය කරයි.<br>▪ අභිරූපණය සම්බන්ධ ක්‍රමවේදයන් විස්තර කරයි. | ▪ අභිරූපණය යන්න කුමක්දැයි හඳුනාගනිමින් විවිධ අභිරූපණයන් ඉදිරිපත් කරයි. | 3.6 - විවිධ චරිත සහ අවස්ථා අභිරූපණය මගින් ඉදිරිපත් කිරීම. | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 5.1 නාට්‍ය පෙළ රස විඳියි. | ▪ නාට්‍ය පෙළින් මතුවන තේමාව ප්‍රකාශ කරයි.<br>▪ පෙළෙහි නාට්‍යමය ගුණය මතුකර දක්වයි.<br>▪ චරිතවල ගති ස්වභාවයන් විස්තර කරයි. | ▪ පාලිත ලොකුපෝතාගමගේ අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍ය පිටපත ඇසුරින් තේමාව,කතා වස්තුව සහ චරිත නිරූපණය, ගැටුම් අවස්ථා ,සහ ආනුෂංගික විමසීම. | 5.1 - තේමාව ,කතා වස්තුව, චරිත පිළිබඳ විමසීම. | 02 |
| | 5.2 නාට්‍ය නිෂ්පාදනය රස විඳියි. | ▪ අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍යයේ රූපණය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>▪ අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍යයේ ආනුශංගික ශිල්ප භාවිතය පිළිබඳ විස්තර කරයි. | ▪ නාට්‍ය නිෂ්පාදනය රස විඳීම.<br>▪ රූපණය,<br>▪ ආනුශංගික ශිල්ප භාවිතය. | 5.2 නාට්‍ය නරඹමු විමසමු විඳිමු. | 05 |